# ටිබෙට් බුදුදහම ව්‍යාප්තියෙහි ලා පාදක වූ පැරණි බෞද්ධ ආරාම පිළිබඳ අධ්‍යයනයක්

ආර්.ඩී.එස්. හේමලතා[1]

## Abstract

There are evidences that monasteries were built in Tibet since the early days of arrival the Buddhism with the influence of Nepal, China and Indian art. Nevertheless, since the early times, Tibetan architecture has developed in a manner appropriate to the country. There are several common architectural features that can be seen in every Buddhist monastery built in this way. The monastery grounds are often beautiful places, the roof is designed in a flat form, beautiful paintings are created on the monastery walls are some of them. The contribution of the old Buddhist monasteries of Tibetan is also very important in spreading Buddhism throughout Tibet. With the beginning of sectarianism in Tibet, the separation of monasteries into sects is one of the main features that can be seen in the monastic culture of that country. Discovering the unique old Buddhist monasteries that were created in accordance with the local architecture, discovering the architectural development stages of those monasteries and uncovering the related facts is aimed through the present article.

**Keywords**: *Tibetan architecture, Ancient Buddhist monasteries, Monastic Architecture*

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය,

## හැඳින්වීම

බුදුදහම ව්‍යාප්ත වූ ආසියාවට අයත් රටවල් අතර ටිබෙටය විශේෂත්වයක් ගනී. ඊට හේතුව අනෙකුත් ආසියාතික රටවලට වඩා ආරම්භයේ සිට ම ටිබෙටයේ බුදුදහම ව්‍යාප්තවීම හා දේශීයකරණයට ලක්වීම වෙනස් ආකාරයකට සිදුවී තිබීමයි. නව රටක විදේශ ආගමක් මුල්බැස ගැනීමේදී ඒ සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ භූමියකට හිමිකම් කීමය. ඒ අනුව ආරම්භයේ සිට ම ටිබෙට් බුදුදහම වෙනුවෙන් ද ආරාම නිර්මාණය වී තිබේ. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලැබී ඇත. වරින් වර ඉන්දියාවෙන් පැමිණි ප්‍රකට පැවිදි ආචාර්යවරු භාරත විශ්වවිද්‍යාලයවලින් තමන් ලත් ශික්ෂණය අනුව යමින් ටිබෙට් භාෂාවට ධර්ම ග්‍රන්ථ පරිවර්තනය කිරීම හා ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරතවීම සිදුකර තිබේ. ඉන්දියාවෙන් වැඩම කළ උන්වහන්සේලා උදෙසා පළමුව ටිබෙට් දේශය තුළ ආරාම ඉදිවූ බව ප්‍රකට කරුණකි. රැගෙන ආ ධර්ම ග්‍රන්ථ ටිබෙට් භාෂාවට පරිවර්තනය කිරීමේදී ආරාමගත සංස්කෘතිය අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්විය.

වර්තමාන නේපාලය බුද්ධචරිතය හා සම්බන්ධ සිදුවීම්වලට අදාළ ප්‍රදේශයකි. එහි බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පය ව්‍යාප්ත වූයේ අශෝක අධිරාජ්‍ය කාලයේ චාරුමතී කුමරියගේ කැපවීම මතය. එසේ ව්‍යාප්ත වූ නේපාල බෞද්ධ කලාවේ ආභාසය ටිබෙටයට ද ලැබුණි. එසේ ම මහායාන බුදුදහම ව්‍යාප්ත වූ චීන බෞද්ධ කලාව ද ටිබෙටය පුරා ව්‍යාප්ත විය. ඒ හැරුණු කොට මධ්‍යකාලීන ඉන්දියානු බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ ආභාසය ද ටිබෙට් කලාව කෙරෙහි නොඅඩුව ලැබුණ බවට සාධක තිබේ. විදේශ රටවලින් ලත් ගෘහනිර්මාණ ශිල්පය ටිබෙටයට අවැසි පරිදි සකස් කොට භාවිත කිරීම ටිබෙට් බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. ටිබෙටයේ පැරණි සුවිශේෂ බෞද්ධ ආරාමවල වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනයේදී ඒ පිළිබඳ කරුණු අනාවරණය කරගත හැකි ය.

## පර්යේෂණ ගැටලුව

ටිබෙට් රටේ ඉදිකරන ලද සුවිශේෂ පැරණි බෞද්ධ ආරාම මොනවාද? යන්න මෙහිදී පර්යේෂණයට ලක් කෙරේ.

**පර්යේෂණ අරමුණු**

ටිබෙට් රටේ ඉදිකර ඇති සුවිශේෂ පැරණි බෞද්ධ ආරාම මොනවාද යන්න හඳුනාගැනීම හා එම ආරාමවල සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හඳුනාගැනීම.

**පර්යේෂණ සීමා**

ආරම්භක යුගය (ක්‍රි.ව.580-763) සිට ෆෝඩ්-බ-ප-යුගය (ක්‍රි.ව.1376-1664) දක්වා අතර කාලය තුළ ඉදිකරන ලද සුවිශේෂ පැරණි බෞද්ධ ආරාම මෙහිදී අධ්‍යයනයට ලක් කෙරේ.

**සාහිත්‍ය විමර්ශනය**

ටිබෙට් රටේ ඉදිකරන ලද පැරණි බෞද්ධ ආරාම පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් මෙතෙක් සිදුවී ඇති බවක් නොපෙනේ. එහෙත් ටිබෙට් බුදුදහම පිළිබඳ ව සාකච්ඡා කර ඇති තැන්වල ඉතා සුළු වශයෙන් බෞද්ධ ආරාම පිළිබඳ ව සාකච්ඡා කර ඇති බවට සාධක සොයාගත හැකි ය. Motilal Banarsidass විසින් 1975 දී රචනා කර ඇති The Buddhism of Tibet නමැති ග්‍රන්ථයෙහි The spread of Buddhism to Tibet යනුවෙන් දක්වා ඇති පරිච්ඡේදයේ ටිබෙටයේ පැරණි බෞද්ධ ආරාම පිළිබඳ මතුපිටින් ස්පර්ශ කිරීමක් සිදුකර ඇත. L. Austine Waddell විසින් 1979 දී රචනා කර ඇති Buddhism & Lamaism of Tibet නමැති ග්‍රන්ථයෙහි Temples and Cathedrals යනුවෙන් පරිච්ඡේදයක් දක්වා ඇත. එහි ටිබෙට් පැරණි බෞද්ධ ආරාම පිළිබඳ තොරතුරු ස්වල්ප වශයෙන් දැකගත හැකි ය. K. Krishna Murthy විසින් 1989 දී රචනා කර ඇති Buddhism in Tibet නමැති ග්‍රන්ථයෙහි පස්වන පරිච්ඡේදය වෙන්කර ඇත්තේ ටිබෙටයේ ගෘහනිර්මාණ ශිල්පය විස්තර කිරීම සඳහා ය. එයින් ද පැරණි බෞද්ධ ආරාම අධ්‍යයනයෙහි ලා යම් ආලෝකයක් ලබාගත හැකි ය.

ටිබෙටයේ සුවිශේෂ පැරණි බෞද්ධ ආරාම පිළිබඳ කරුණු අධ්‍යයනයේදී සිංහල මාධ්‍යයෙන් රචනා කරන ලද ග්‍රන්ථ දැකගැනීම ඉතා දුර්ලභය. ඊට යම් තරමක හෝ පිටිවහලක් ලැබෙතැයි සැලකෙන ග්‍රන්ථ කිහිපයක් මෙහිලා දැක්විය හැකි ය. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි

විසින් 1996 දී රචනා කරන ලද බෞද්ධ දර්ශනය ග්‍රන්ථයෙහි බුදුදහම විදේශයන්හි පැතිරීම පිළිබඳ ව සාකච්ඡා කර ඇති පරිච්ඡේදයෙහි ටිබෙටයේ පැරණි බෞද්ධ ආරාමවල නම් කිහිපයක් නාමමාත්‍රික වශයෙන් පමණක් සඳහන් කර ඇත. 2017 දී අලුත්ගම විමලරතන හිමි, දුනුකේඋල්ලේ සාරානන්ද හිමි, නිලන්ත පී දිසානායක යන අය විසින් ප්‍රකාශයට පත්කර ඇති ආසියාවේ බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය නම් ග්‍රන්ථයේ තිබ්බත දේශයේ බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය නමින් පරිච්ඡේදයක් දක්වා ඇත. එහි තිබ්බතයේ බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයේ ආරම්භය හා තෝරාගන්නා ලද ප්‍රසිද්ධ ආරාම කිහිපයකට පමණක් අවධානය යොමුකර තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රාමාණික සාහිත්‍ය ග්‍රන්ථ අධ්‍යයනයෙන් සිදුකර ඇත.

**ටිබෙට් ආරාමික වාස්තුවිද්‍යාවේ ස්වභාවය**

ටිබෙට් රටට බුදුදහම හඳුන්වා දීමේදී පුරෝගාමීව කටයුතු කලේ භාරත හා චීන බෞද්ධ භික්ෂූන් වහන්සේලා ය. විශේෂයෙන් ම ත්‍රි සොන්ග්-දෙව්-ත්සන් රාජ්‍ය කාලයේ ඉන්දියානු ජාතික කුසර නොහොත් කුමාර්, නේපාල් ජාතික ශීල මංජු සහ කාශ්මීර ජාතික කුක් යන පඬිවරු ද චීන ජාතික මහාදේව හා ධර්මකෝෂ යන භික්ෂූන් වහන්සේලා ද බෞද්ධ ග්‍රන්ථ පරිවර්තනය සඳහා ටිබෙට් රටට පැමිණ ඇත (ආනන්ද හිමි, 1968, පි. 195). ඒ අනුව ටිබෙට් බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයට නේපාලය, චීනය සහ ඉන්දියානු කලාවේ බලපෑම නොඅඩුව ලැබුණි. විශේෂයෙන් ම මධ්‍යකාලීන ඉන්දියානු ආභාසය ලබා ඇත (Waddell, 1978, 260p.). එසේ වුවද මුල් කාලයේ සිට ම ටිබෙට් ගෘහනිර්මාණ ශිල්පය එරටට යෝග්‍ය ආකාරයෙන් වර්ධනය වී තිබේ. මෙහි සෑම ගොඩනැගිල්ලක් ම ස්වාභාවික ආපදාවලට ඔරොත්තු දෙන ආකාරයට සැලසුම් කර ඇත. ආරාම නිර්මාණයේදී භාවිත කරන ලද ද්‍රව්‍ය අතර ගඩොල් ප්‍රධාන ය. හිරු එළිය හොඳින් ලැබෙන සේ වාකවුළු තබා ඇත. ටිබෙටය පුරා බෞද්ධ ආරාම විහිදී තිබේ. ඒවායින් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ බාහිර ලෝකයෙන් වෙන්වූ උස් කඳු මුදුන්වල ය (Waddell, 1973, 256p.).

ඓතිහාසික වාර්තාවලට අනුව ටිබෙටයේ විහාරස්ථාන තුන්දහසකට අධිකව ඇත (Murthy, 1989, 50p.). ටිබෙට් භික්ෂූන් වහන්සේලාගේ (Lamas) වාසස්ථාන පොදුවේ හඳුන්වා ඇත්තේ Gonpa නමිනි (Murthy, 1989, 51p.). ඇතැම් ආරාම කුඩා නගර වැනිය (Waddell, 1973, 260p.). ආරාම වපසරිය එතරම් ම විශාලය. ඒ සෑම විහාරයකට ම අදාළ වන පොදු ලක්ෂණ කිහිපයක් පවතී. ආරාම භූමිය බොහෝවිට මනරම් ස්ථානයක් වීම, වහළය පැතලි ආකාරයෙන් නිර්මාණය කර තිබීම, ආරාම බිත්ති මත අලංකාර චිත්‍ර නිර්මාණය කර තිබීම ඒ අතර විශේෂය. ප්‍රධාන වශයෙන් ම ආශ්‍රම චතුරස්‍රාකාර හෝ ඍජුකෝණාස්‍රාකාර හැඩයක් ගෙන තිබේ. ඒ සෑම එකක්ම සම්මන්ත්‍රණ ශාලාවකින්, සක්මන් මළුවකින් හා කුටිවලින් සමන්විතය. ආරාමයක ප්‍රධාන ගොඩනැගිල්ල වන්නේ රැස්වීම් ශාලාව ය (Waddell, 1973, 260p.).

## දේශීය ආරාම නිර්මාණය

ඓතිහාසික වාර්තාවලට අනුව ටිබෙටය තුළ බුදුදහම ව්‍යාප්ත වී ඇත්තේ ක්‍රමානුකූලවය. ඒ අනුව ආරම්භක යුගය (ක්‍රි.ව.580-763), ශාන්තරක්ෂිත යුගය (ක්‍රි.ව.763-982), දීපංකර යුගය (ක්‍රි.ව.1042-1102), සකස්‍ය යුගය (ක්‍රි.ව.1102-1376), චෝඩ්-බ-ප-යුගය (ක්‍රි.ව.1376-1664) සහ වර්තමාන යුගය (ක්‍රි.ව.1664 සිට) යන කාලපරිච්ඡේද ඔස්සේ ඒ පිළිබඳව අධ්‍යයනය කළ හැකිය (පඤ්ඤාකිත්ති හිමි 1996, 364). බුදුදහම පැමිණි මුල් කාලයේ සිට ම ටිබෙටයේ ආරාම සංස්කෘතිය ගොඩනැගුණ බවට ලිඛිත සාධක තිබේ. ක්‍රි.ව. 639 දී ලාසා (Lasha) අගනුවර කරගත් ශ්‍රොන්-සාන්-ගම්පෝ (ස්‍රොංසාංගම්පෝ) (බුද්ධදත්ත හිමි 2014, 173). (Sron-btsan-Sgam-Po) රජු එම වර්ෂයේදී ම නේපාලයේ අන්සුවර්මන් (Aimsuvarman) රජුගේ දියණිය වූ භක්තිදේවි (භෘකුටි) (Bhrukuti) කුමරිය සරණපාවා ගෙන ඇත. ඉන් අවුරුද්දකට පසුව තායි-ෂූ (තායිසුං) නමැති චීන අධිරාජයාගේ දියණිය වූ වැන්ජෙන් (වැන්චෙන්ග්) කුමරිය ද විවාහ කර ගත් බව සඳහන් වේ. නේපාලයේ කුමරිය පිළිබඳ විවාහ යෝජනාව ඇගේ පියා විසින් යැවූ අවස්ථාවේදී රජු ප්‍රකාශ කර ඇත්තේ "අශිෂ්ට රාජ්‍යයක් වන තිබ්බතයෙහි රජකම කරන මා දසරාජ ධර්මය පිළිපදින්නෙක් නොවේ. එහෙත් ඔබගේ දියණිය ආවාහ කර ගැන්මේ භාග්‍යය මට ලැබුණහොත් මම එකී දස ධර්මය නොකඩවා රකින්නෙමි. තවද පන්දහසක් සිද්ධස්ථාන ඉදිකරන්නෙමි" යනුවෙනි (ආනන්ද හිමි 1968, පි. 191). මෙම පොරොන්දුව

පරිදි පන්දහසක් සිද්ධස්ථාන ඉදිකිරීම කෙතරම් දුරට සාර්ථක වූයේදැයි කිව නොහැකි නමුත් ශ්‍රොන්-සාන්-ගම්පෝ රජතුමා බුදුදහම වැළඳගත් පසුව බුදුදහම ආරක්ෂා කරගනු වස් දැඩි උනන්දුවකින් කටයුතු කළ බවට සාධක තිබේ.

නේපාල් රාජ කුමරිය තිබ්බතයට එනවිට අක්ෂෝභය බුදුන්ගේ පිළිමයක් හා සඳුන් ලීයෙන් නෙලන ලද තාරා දේවියගේ පිළිමයක් ද ලහාසා නගරයට ගෙන ආ බව සඳහන් වේ. චීන රාජ කුමරිය විසින් තමාට ලැබුණු දායාද වශයෙන් බුද්ධ ප්‍රතිමාවක් තිබ්බතයට ගෙනවිත් තිබේ. මෙම බුද්ධ ප්‍රතිමාව භාරතයෙන් මධ්‍ය ආසියාවටත් එහි සිට චීනයටත් ගෙන යන ලද්දකි (ප්‍රඥානන්ද හිමි, 1960, පි. 14). එය තැන්පත් කිරීම සඳහා ලහාසා නගරයේ උතුරු දිශාවේ ර-මො-ජෙ නමින් විහාරයක් ඉදිකර තිබේ. නේපාල කුමරිය ගෙන ගිය ප්‍රතිමාව තැන්පත් කිරීම සඳහා  ලහාසා නගර මධ්‍යයෙහි විශාල ජලාශයක් ගොඩකරවා බු-ල්-ස්නඩ් හි සුන්දර විහාරයක් ඉදිකරන ලදී. පසුකාලයේදී භට්ටාරක (ස්වාමි) නමින් හඳුන්වා ඇත්තේ එය යි. ඊට අමතරව ලාසා නගරයේ රමෝෂේ සහ ජොබාන්ග් නම් පූජනීය ස්ථාන ඔහු විසින් ගොඩනංවන ලදී. එකොළොස් මහලකින් යුතු පොතලා මාළිගය (Potala) ඉදිකරන ලද්දේ ද මේ රජු විසිනි (ගුණසේකර, 2006, පි. 115). රජතුමා විසින් පංචකූටපර්වතයන්හි විහාර එකසිය අටක් (108) කරවූ බව ද සඳහන් වේ (බුද්ධදත්ත හිමි, 2014, පි. 175). චීන දේවිය මියයාමට පෙර තමන් ගෙනා බුදුරුව පිහිටුවා තිබූ රමෝජෙ නමැති විහාරයෙන් එය ගෙනවුත් 'යූල්නං' නම් තැන තබා ඇත (බුද්ධදත්ත හිමි, 2014, 175).

ටිබෙට් ඉතිහාසයේ නව බෞද්ධ යුගයක් හඳුන්වා දීමේ පුරෝගාමියෙකු වූ ක්‍රි-ස්‍රොං ඩෙබ්ත්සන් (Kri-sron-lde-blsan) රාජ්‍ය කාලයේ බුදුදහමට අභියෝගකාරී තත්ත්වයක් උදාවී තිබුණි. විදේශ ආගමක් වූ බුදුදහම තහවුරු කිරීමට නම් දේශීය ඇදහිල්ලක් වූ බොන් ඇදහිල්ල සමග තරග කරන්නට සිදුවිය. එම කාලය තුළ වෙහෙර විහාර ඉදිවීමක් ගැන සඳහන් නොවේ.  ශ්‍රොං සං-ගම්පෝ රජුගෙන් පසුව බුදුදහම රාජ්‍ය ආගම වශයෙන් ටිබෙට් දේශය තුළ ස්ථාපිත වූයේ ස්‍රොං ඩෙජ්ත්සන් (ක්‍රි.ව.755-797) රාජ්‍ය කාලයේදී ය. එකල බුදුදහම ටිබෙට් දේශය තුළ ව්‍යාප්ත කිරීමේ කාර්ය පැවරුනේ භාරත නාලන්දා

විශ්වවිද්‍යාලයෙන් වැඩම කරවන ලද ශාන්තරක්ෂිත හිමියන්ටය. ඒ අනුව ටිබෙට් රටට බුදුදහම පැමිණ දීර්ඝ කාලයක් ගතවී තිබුනද විධිමත් ලෙස වෙහෙර විහාර ඉදිකිරීමක් සිදුවූ බවක් නොපෙනේ. විධිමත් ලෙස මුල්වරට විහාරයක් ඉදිකරන ලද්දේ ක්‍රි.ව.776 දී ශාන්තරක්ෂිත තෙරුන් වහන්සේ වැඩම කිරීමෙන් අනතුරුව උන්වහන්සේගේ උපදෙස් මත ය. එහි වැඩ කටයුතු ක්‍රි.ව.778 දී අවසන් කරන ලදී. ඒ අනුව ඉදිකරන ලද පළමුවන මහා ආරාමය වූයේ සම්යස් (Basam-yas) විහාරය යි. තිබ්බතයේ වැසියන් කිහිප දෙනෙකු පැවිදි කොට උපසම්පදා කිරීමෙන් අනතුරුව තිබ්බතයේ බෞද්ධ පැවිදි ශාසනය ඇති විය. එය තිබ්බතය පුරා විහාර ඉදිකිරීමට සුවිශාල රැකුලක් වූවා සේ ම තිබ්බතය තුළ බුදුදහම ප්‍රතිෂ්ඨාපනය වීමට ද හේතු විය.

ක්‍රි.ව. 1358 දී අම්ඩෝ ප්‍රාන්තයේ උපත ලැබූ සොන්-ඛො-පා (Tson-Kha-Pa) විසින් ගෙ-ලුන්ග්-පා (Dge-Lugs-Pa) නිකායේ භික්ෂූන් සඳහා ආරාමයක් නිර්මාණය කර ඇත. එය ක්‍රි.ව. 1408 දී ලාසා නුවරට නුදුරෙන් ගැන්ඩන්හි ඉදිකර තිබේ. අනතුරුව සොන්-ඛා-පාගේ ශිෂ්‍යයන් විසින් ලාසා ආසන්නයේ දෙපුන්ග්, සේරා සහ සැන්ග් පළාතේ තාෂි ඉහුම්පෝ (Thasi Ihumpo) නමින් ආරාම ඉදිකර ඇත. අධ්‍යාපන කේන්ද්‍රස්ථාන වශයෙන් ක්‍රියාත්මක කර ඇති මෙම ආරාම මගින් ප්‍රධාන වශයෙන් ම මොංගෝලියාවේ සහ සයිබීරියාවේ ධර්මය ව්‍යාප්ත කිරීම සිදුකර ඇත. ඉන්දියාවෙන් ලද බෞද්ධ ග්‍රන්ථ ටිබෙට් භාෂාවට පරිවර්තනය කළේ ද මෙම ආරාම කේන්ද්‍රකරගෙන ය (Banarsidass, 1975, 18p.).

එකොළොස්වන සියවස පමණ දක්වා ටිබෙටයේ නිකාය භේදයක් නොවුණි. නමුත් එකොළොස්වන සියවසේ සිට විවිධ නාම සහිත නිකාය බිහිවිය. එය ආරාම ව්‍යාප්තියේ වෙනස්කම් ඇතිවීමට හේතු විය. විශේෂයෙන් ම උර්ග්යෙන්පා නිකායේ ලාමාවරුන්ගේ ආරාම වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ නැගෙනහිර ටිබෙටයේ සම්යේ නගරය කේන්ද්‍රකරගෙන ය. නැගෙනහිර ටිබෙටයේ බ්‍රිකුන්ග් ආරාමය මූලස්ථානය කරගත් ලාමාවරු බ්‍රිකුන්ග්පා නම් නිකාය නියෝජනය කරති (ඉලංගසිංහ, 1997, පි. 46-47). මේ අනුව ටිබෙටයේ ආරාම බිහිවීම හා සංවර්ධනය බුදුදහමේ ව්‍යාප්තියේ ස්වභාවය සමග සෘජුව

බැඳී පවතින බව කිව හැකි ය.

## සුවිශේෂ පැරණි බෞද්ධ ආරාම

ටිබෙට් රටේ එක් පවුලක පුතුන් සිව් දෙකතු සිටී නම් ඉන් එක් අයෙක් නොවරදවා ම පැවිදිවීම සිරිතක් වශයෙන් පැවතිණි. එසේ පැවිදි බවට ඇතුළු වන්නේ ද වයස අවුරුදු අටේදී හෝ හතරේදී පමණ විය (සිරිසීවලී හිමි, 2016, පි. 345). එසේ පැවිදි වන අය සඳහා ටිබෙටයේ විශාල ආරාම මෙන්ම කුඩා ආරාම සිය ගණන් ඉදි කෙරුණි. මෙහිදී අවධානය යොමු කරන්නේ එසේ ඉදිකරන ලද පැරණි ප්‍රධාන ආරාම කිහිපයකට පමණි. Lasha ys Sam-ye, Gah-IDan, De-pungs, Sera, Tashi Lun-po, the Heap of Glory, Ra-dang, Sa-skya, Phuntsholing, Sam-ning, De-kung, Mindolling, Jakhang, Ramoche" Shigatse ysTashilhunpo, Tsurphu, Trandruk, Norbulingka යන ආරාම ඒ අතර ප්‍රධාන තැනක් ගනී. මෙම ආරාම අතරෙන් ටිබෙටයට බුදුදහම පැමිණි මුල් කාලයේ ඉදිකරන ලද හා එරට බුදුදහමේ ව්‍යාප්තියට ප්‍රධාන වශයෙන් බලපාන ලදැයි සැලකෙන පැරණි විහාරස්ථාන කිහිපයක් පවතී.

## Sam-ye

ටිබෙටයේ ඉදිකරන ලද මුල්ම ආරාම අතර Sam-ye විහාරස්ථානය ප්‍රධාන තැනක් ගනී. එය Lasha ආසන්නයේ ඉදිකර තිබේ. විහාරස්ථානයේ සම්පූර්ණ නම bsam-yes-Mi-gyur bhun-gyis grub-pali Tsung-lag-Kan ලෙස සටහන් වී තිබේ (Murthy 1989, p. 52). ක්‍රි.ව.749 දී පමණ Thi-Sron Detsan විසින් ඉන්දියාවෙන් වැඩම කරන ලද ශාන්තරක්ෂිත හා පද්මසම්භව යන භික්ෂූන් දෙනම උදෙසා මෙම විහාරය ඉදිකරන ලදැයි කියැවේ. මෙය මගධයේ ඕදන්තපුරි විශ්වවිද්‍යාලය පූර්වාදර්ශයට ගෙන නිර්මාණය කර ඇතැයි සැලකේ (බුද්ධදත්ත හිමි, 2014, පි. 178). විශාල ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව ඇති එය ආරාම සංකීර්ණයක් සේ සකස් කර ඇත. මහාප්‍රාසාද දොළහක් සහ ශාලා දෙකක් ද ආර්යපාල නමින් හඳුන්වන ලද පිළිම ගෙයක් ද ඊට අයත් විය. මහාප්‍රාසාද දොළහ භික්ෂු නිවාස ලෙස භාවිත කෙරුණි. ප්‍රධාන විහාරයේ සතර කොනේ තරමක් දුරින්

පිලිස්සූ ගඩොලින් නිල් සහ රතු පැහැති දර්ශනීය ස්තූප සතරක් විය. විහාරය මැදිවන සේ චක්‍රමාලා මෙන් උසැති ප්‍රාකාරයක් විය. එහි සිව් දිශාවට දොරටු සතරක් විය. ප්‍රධාන ආරාම ගොඩනැගිල්ල වටා අවශේෂ ගොඩනැගිලි හතරක් ඉදිකිරීමේ සම්ප්‍රදාය අනුරාධපුර යුගයේ ලාංකේය ආරාමික වාස්තුවිද්‍යාව තුළ ද දැකගත හැකි විශේෂ සංකල්පයකි. K.Krishna Murthy සඳහන් කරන ආකාරයට එහි ඉදිකර තිබූ ප්‍රධාන ගොඩනැගිලි හතරෙන් එක් බිත්තියක මුදුනේ පුරාණ ඉන්දියානු අක්ෂර සහිත සෙල්ලිපි කිහිපයක් ද චෛත්‍යයක සටහනක් ද ඇත. එහි ඉතා විශාල බුද්ධ රූප හයක් ද තැන්පත් කර ඇත. ක්‍රි.ව. 12 වන සියවසේදී මෙම ආරාමය කිසියම් හේතුවක් මත ගින්නකට හසුව විනාශ වී ඇති අතර එම වර්ෂයේදී ම රවලො-ව-වර්දෙ-ර්ජෙ-ගුස්ස් තුමා විසින් නැවත එය ප්‍රතිසංස්කරණය කර තිබේ.

ආරම්භක කාලයේ ශාන්තරක්ෂිත තෙරුන් වහන්සේ වැඩසිටි මෙම ආරාමය ටිබෙටයේ ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානය ද විය. එවකට ඉන්දියාවේ ද දක්නට නොලැබුණ බෞද්ධ ග්‍රන්ථවලට අයත් අත්පිටපත් කිහිපයක් මෙම විහාරස්ථානයේ දැකිය හැකි වූ බවත් නමුත් ඒවායින් විශාල ප්‍රමාණයක් ක්‍රි.ව.1810 වන විට විනාශ වී ගොස් ඇති බවත් වාර්තා වේ (Murthy 1989, 52p.).

## Gah-IDan

මෙම ආරාමය ක්‍රි.ව.1409 දී Tshong-Kha-Pa විසින් ඉදිකර ඇත. මෙය සමස්ත ටිබෙට් භික්ෂූන් වහන්සේලාට උපදෙස් ලබාදීමට පිහිටුවන ලද ආයතනයක් හා පාරභෞතික විද්‍යාව, ගුප්ත විද්‍යාව පිළිබඳ උගන්වන ලද මධ්‍යස්ථානයක් ලෙසත් ප්‍රසිද්ධ ය.

## De-pungs

ක්‍රි.ව.1415 දී Jam-dbyans-Chos-rje විසින් මෙම විහාරය ඉදිකරන ලදැයි සැලකේ. පුරාණ Sudhānyakū ඒ ආරාමයේ ආකෘතියට අනුව ඉදිකර ඇති මෙම විහාරයේ ලෞකික හා ලෝකෝත්තර තත්ත්වවලට අදාළ විවිධ ඉගැන්වීම් සිදුකර තිබේ.

## Sera

ක්‍රි.ව.1418 දී Tshong-Kha-Paගේ ගෝලයෙක් විසින් මෙම විහාර සංකීර්ණය ඉදිකරන ලදැයි සැලකේ. මුල් කාලයේ සිටම තනි විහාරයකට වඩා මෙය විශ්වවිද්‍යාලයක් වශයෙන් ක්‍රියාත්මක කර ඇත. මෙම ආරාම සංකීර්ණයේ වැඩවාසය කළ භික්ෂූන් වහන්සේලා Tibet, Amdo, Kham, Mongoliya යන ප්‍රදේශවල වංශවත් පවුල්වලට අයත් වූවන් වශයෙන් සැලකේ. බුදුරජාණන් වහන්සේ මාර පරාජය කරන අවස්ථාව දැක්වෙන ප්‍රතිමාවක්, චීනයෙන් ගෙනඑන ලද ප්‍රතිමා කිහිපයක් හා හිස් එකොළහක් සහිත අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් ද අමිතාභය, මෛත්‍රීය ආදී බුද්ධ ප්‍රතිමා ද මෙහි තැන්පත් කර තිබූ බව සඳහන් වේ.

## Tashi Lun-po, the Heap of Glory

Lashaවලට දකුණින් පිහිටා ඇති මෙම විහාරස්ථානය ක්‍රි.ව.1445 දී Ge-dun-dubගේ උත්සාහයෙන් ඉදිකරන ලද්දකි. මෙහි භික්ෂූන් වහන්සේලා 3800 පමණ වාසය කර ඇත. ආරාමයට අනුබද්ධ ප්‍රධාන ඉගැන්වීමේ මධ්‍යස්ථාන හතරක් පවැති අතර එම ආයතනවල තාන්ත්‍රික ධර්මයට අයත් ග්‍රන්ථ ඉගැන්වීම සිදුකර තිබේ.

## Ra-dang

Lashවලට ඊශාන දිශාවෙන් පිහිටා ඇති මෙම විහාරස්ථානය ක්‍රි.ව.1055 දී Atiśa භික්ෂුවගේ ශිෂ්‍යයෙකු වන Brom-ton විසින් ආරම්භ කරන ලදැයි සැලකේ. එහි වාසය කළ භික්ෂූන් වහන්සේලා Kadam-pa නිකාය නියෝජනය කර ඇත. Atiśa භික්ෂුවගේ මරණින් පසුව උන්වහන්සේගේ දේහය රිදී සොහොන් ගෙයක් තනවා මෙම ආරාමයේ තැන්පත් කර ඇතැයි සැලකේ (Murthy 1989, 54p.).

## Sa-skya

ක්‍රි.ව.1071 දී Sa-sky Kon-dkon Mchog Rgyal-po තෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් මෙම ආරාමය ආරම්භ කර ඇත. ප්‍රධාන ගොඩනැගිල්ල මහල් හතකින් සමන්විත වන අතර The White Hall of Worship නමින් හැඳින්වෙන විශාල ශාලාවකින් ද යුක්තය. ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා

භාරතයෙන් ටිබෙට් දේශයට වැඩම කරන ලද ආලම්කදේව, ධර්මධර, ශාක්‍යශ්‍රීභද්‍ර, සුමනංශ්‍රී ආදී උගත් භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය වූ සහය මෙම විහාරස්ථානයෙන් ලබාදී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් භාරතයෙන් ගෙනඑන ලද ධර්ම ග්‍රන්ථ රැසක් ටිබෙට් භාෂාවට පරිවර්තනය කිරීමට ද හැකියාව ලැබී තිබේ. ඒ අනුව ටිබෙට් භාෂාව හා ආගමික සාහිත්‍ය පෝෂණයට Sa-skya විහාරස්ථානයෙන් ලබාදී ඇති සහයෝගය ඉතා ප්‍රශංසනීය වේ.

## Sam-ning

Nying-ma-pa නිකාය නියෝජනය කරන මෙම ආරාමය ටිබෙට් දේශයේ ඇති අනෙකුත් ආරාම අතරෙන් වෙනස් වූවකි. එහි භික්ෂු-භික්ෂුණී යන උභය පාර්ශ්වය සඳහා වෙන් වෙන් වශයෙන් ආරාම නිර්මාණය කර ඇත. ප්‍රධානත්වය හොබවන්නේ භික්ෂුණීන් වහන්සේ නමකි.

## Jokhang

Jokhang විහාරය මීට වසර එක්දහස් තුන්සීයකට පමණ පෙර නිර්මාණය කරන ලද්දක් බවට අනාවරණය කොටගෙන ඇත. බුද්ධ හා විවිධ දේව ප්‍රතිමා මෙහි දක්නට ලැබේ. ප්‍රධාන ශාලාව ශාක්‍යමුනි බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිමාව සඳහා ද පැති ශාලා දේවතා රූප තැන්පත් කිරීමට ද වෙන්කර ඇත. වරින් වර ප්‍රතිසංස්කරණවලට ලක්වී ඇති මෙම විහාරය හත්වන ශත වර්ෂයේ ඉන්දියානු සහ චීනයේ ඕබට රාජධානි සමයේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ පෙන්නුම් කරයි. සමස්ත ගොඩනැගිල්ල චතුරස්‍රාකාර හැඩයක් පෙන්නුම් කරයි. ඉදිකිරීම් තාක්ෂණයේ ද්‍රව්‍ය භාවිතයෙන් එය සංකීර්ණ ස්වරූපයක් ප්‍රකට කරයි. ඒ අනුව දොරටු සඳහා ශිලා ද බිත්ති සඳහා ගඩොල් ද ගෘහයේ අභ්‍යන්තරයට දැව ද යොදාගෙන ඇත. ශාලා දොරටු, පටු ආලින්ද කුළුණු, දොර හිස යනාදිය සිතුවම් මගින් අලංකාර කර ඇත (විමලරතන හිමි 2017, පි. 208). සිතුවම්කරණයේදී භාවිත කර ඇති නිර්මාණ ශිල්පීය ක්‍රමය, මෝස්තර රටා හා වර්ණ භාවිතය ඉන්දියාවේ හයවන ශතවර්ෂයේ නිර්මාණය කරන ලදැයි සැලකෙන Avidhakar ගුහාවේ සිතුවම්කරණයට සමානවීම විශේෂ ලක්ෂණයකි.

## Romoche

ටිබෙට් වාර්තාවලට අනුව මෙම විහාරය සිංහයෙකුගේ ඉහළ හනුවේ හැඩය හෝ U හැඩයට නිර්මාණය වූවකි. සමස්ත ගොඩනැගිල්ල නැගෙනහිර ආසියාතික ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ ප්‍රකට කරයි. බිත්ති නිර්මාණයේදී ගඩොල් සහ ගල් භාවිත කර ඇත. පිටත බිත්ති ව්‍යාස්‍රයන්ගේ වර්ණයට සමාන වර්ණයකින් අලංකාර කර තිබීමෙන් ස්වභාව ධර්මය සමග කෘත්‍රිම ඉදිකිරීම ඒකාබද්ධ කිරීමට දරන ලද උත්සාහය ප්‍රකට වේ. ටිබෙට් පැරණි ආරාම ගෘහ නිර්මාණ ශිල්පයට ලෙන් විහාර ද ඇතුළත් වේ. නමුත් ලෙන් විහාර සංස්කෘතිය ටිබෙටය පුරා ව්‍යාප්තවීම පටු ස්වභාවයක් ගනී. ඊට හේතුව ස්වභාවික ලෙන් පද්ධති අවමවීම විය හැකි ය. ටිබෙට් බුදුදහම ව්‍යාප්තියේ දෙවන භාගයේ නිර්මාණය කරන ලදැයි සැලකෙන ඖනකය් බමඉමන සහ හ්ටරස ප්‍රාන්තයේ පිහිටා ඇති ගුහාවේ සැකසුම පරීක්ෂා කිරීමෙන් ටිබෙට් බෞද්ධ ලෙන් පද්ධතිය පිළිබඳ දළ අදහසක් ලබාගත හැකි ය. ලෙන් විහාර නිර්මාණයේදී වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ දැව කණුය. දැව කණු නැවත ප්‍රතිසංස්කරණයට ලක් නොවීම හෝ දීර්ඝකාලීන පැවැත්මට ද්‍රව්‍යමය වශයෙන් ඇතිකරන ලද බාදා හේතු කොටගෙන මුල්කාලයේ ඉදිකරන ලද ලෙන් නිර්මාණ පිළිබඳ තොරතුරු ද යටපත් වී ඇත. දැනට ඉතිරිව ඇති අවශේෂ අනුව සිවිලිම මත සිතුවම් නිර්මාණය කිරීමේ සම්ප්‍රදාය ටිබෙට් ලෙන් ආරාම සංස්කෘතිය තුළ භාවිත කර ඇති බව පැහැදිලිය. ඊට අමතරව ලෙන් මත බුද්ධ ප්‍රතිමා සහ ශාක්‍යමුණි ප්‍රතිමා තැන්පත් කිරීම සිදුකර ඇත.

### සමාලෝචනය

ටිබෙට් බුදුදහමේ ආරම්භක යුගයේ (ක්‍රි.ව.580-763) සිට වෝඩ්-බ-ප-යුගය (ක්‍රි.ව.1376-1664) යුගය දක්වා වූ කාලය තුළ ඉතා සුවිශේෂ ආරාම නිර්මාණය වී ඇති බව පැහැදිලි වේ. ටිබෙට් බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පයට ඉන්දියාව, නේපාලය සහ චීන කලාවේ බලපෑම නොඅඩුව ලැබී ඇත. විශේෂයෙන් ම මධ්‍යකාලීන ඉන්දියානු ආභාසය ලැබී තිබේ. එසේ වුවද මුල් කාලයේ සිට ම ටිබෙට් ගෘහනිර්මාණ ශිල්පය එරටට යෝග්‍ය ආකාරයෙන් වර්ධනය වී ඇත. එසේ නිර්මාණය වූ පැරණි බෞද්ධ ආරාමවල පොදු වාස්තුවිද්‍යා ලක්ෂණ කිහිපයක් දැකගත

හැකි ය. ඒ අනුව සෑම ගොඩනැගිල්ලක් ම ස්වාභාවික ආපදාවලට ඔරොත්තු දෙන ආකාරයට සැලසුම් කර ඇත. ආරාම නිර්මාණයේදී භාවිත කරන ලද ද්‍රව්‍ය අතර ගඩොල් ප්‍රධාන ය. හිරු එළිය හොඳින් ලැබෙන සේ වාකවුළු තබා ඇත. ටිබෙටය පුරා බෞද්ධ ආරාම විහිදී තිබේ. ඒවායින් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ බාහිර ලෝකයෙන් වෙන්වූ උස් කඳු මුදුන්වල ය. ටිබෙට් බුදුදහම ව්‍යාප්තියෙහි ලා එම ආරාමවලින් ලැබී ඇති පිටිවහල ද ඉතා වැදගත් ය.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආනන්ද හිමි, වැල්ලවත්තේ, (1968), බෞද්ධ සංස්කෘතිය, සාලිය ප්‍රකාශක සමාගම.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (1996), බෞද්ධ දර්ශනය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ප්‍රඥානන්ද හිමි, ගලගෙදර, (1960), තිබ්බතයේ බොදු සමය, බුද්ධ විහාරය, ලක්නව්.

බාප්ට් .පී. වී (සංස්), ගුණසේකර, පද්මා (පරි.), (2006), දෙදහස් පන්සිය වසරක බොදු සමය, සුනෙර ප්‍රකාශකයෝ, 64, දේවාල පාර, නුගේගොඩ.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (2014 නැවත මුද්‍රණය), ඓතිහාසික ලිපි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10.

විමලරතන හිමි, අලුත්ගම, සාරානන්ද හිමි, දූනුකේඋල්ලේ, දිසානායක, තිලත්ත පී, (2017), ආසියාවේ බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය, කොලිටි ප්‍රින්ටර්ස්, නුගේගොඩ.

සිරි සීවලී හිමි, බඹරැන්දේ, (2016 හය වන මුද්‍රණය), බෞද්ධ ලෝකය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ 10.

Bell, Charles, (1992), The Religion of Tibet, Motilal Banarsidass Publishers Private Limited, Delhi.

Dargyay, M, (1979), The Rise of Esoteric Buddhism in Tibet, Motilal Banarsidass, Delhi.

Jeffrey Hopkings, Lati Rimpoche (Translated), (1975), The Buddhism of Tibet, Motilal Banarsidass, Delhi Varanasi Patna Madras Bangalore.

Murthy, Krishna K, (1989), Buddhism in Tibet, Sundeep Prakashan, Delhi.

Singh, Nagendra KR (Editor), (1999), International Encyclopaedia of Buddhism Vol. 64, Tibet, Anmol Publications PVT. LTD, New Delhi, India.

Waddell, Austine L, (1979), Buddhism & Lamaism of Tibet, Heritage Publishers, New Delhi.